“කවරෙකු දිවුරා හිදිමින් මුස්ලිම් පුද්ගලයකුගේ උරුමය කපා හැරියේ ද සැබැවින්ම අල්ලාහ් ඔහුට අපා ගින්න අනිවාර්යය කළේය. එමෙන්ම ස්වර්ගය ඔහුට තහනම් කළේය.” එවිට පුද්ගලයෙක්: "අල්ලාහ්ගේ දූතයාණනි! එය සුළු දෙයක් වූවත් එසේදැ?"යි එතුමාණන්ගෙන් විමසීය. එවිට "අරාක් (මිස්වාක්) දැහැටියක් වුව ද එලෙසමය" යැයි එතුමාණන් පැවසූහ

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ උමාමා ඉයාස් ඉබ්නු සඃලබා අල් හාරිසී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “කවරෙකු දිවුරා හිදිමින් මුස්ලිම් පුද්ගලයකුගේ උරුමය කපා හැරියේ
ද සැබැවින්ම අල්ලාහ් ඔහුට අපා ගින්න අනිවාර්යය කළේය. එමෙන්ම ස්වර්ගය ඔහුට තහනම් කළේය.” එවිට පුද්ගලයෙක්: "අල්ලාහ්ගේ දූතයාණනි! එය සුළු දෙයක් වූවත් එසේදැ?"යි එතුමාණන්ගෙන් විමසීය. එවිට "අරාක් (මිස්වාක්) දැහැටියක් වුව ද එලෙසමය" යැයි එතුමාණන් පැවසූහ
[صحيح] [رواه مسلم]

මුස්ලිම්වරයකුගේ අයිතිය අහිමි කරනු පිණිස, දැන දැනම බොරු පවසමින් අල්ලාහ් මත දිවුරා සිටීම ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ අවවාද කළහ. සැබැවින්ම එහි ප්රතිවිපාකය වනුයේ අපා ගින්න උරුමකර ගැනීම හා ස්වර්ගය තහනම් කර ගැනීමය. එය මහා පාපයන්ගෙන් එකකි. එවිට මිනිසෙක්, "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි" දිවුරා සිටිනු ලබන දෑහි ස්වල්පයක් තිබුණේ නම්?" යැයි විමසා සිටියේය. එවිට (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ, "එය අරාක් නම් ගසින් ගනු ලබන සිවාක් (දත් මදින) දැහැටියක ප්රමාණයෙන් වුව ද එලෙසමය" යැයි පැවසූහ.

https://sunnah.global/hadeeth/si/show/5430